ඇතැම් අයෙකුට නැරඹීමට අපහසු වන තරමේ සංවේදී ඡායාරූප පළ කිරීමේදී, එම ඡායාරූප අදාළ පුවතේ සමස්ත චිත්‍රයට අත්‍යවශ්‍ය ද යන කරුණ මාධ්‍යවේදීන් සැලකිල්ලට ගත යුතු වේ.

ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරුණු වාර්තා කිරීමේදී, ඊට සම්බන්ධ ඡායාරූප අවශ්‍ය සංවේදීතාවයෙන් හා විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම, පොදු ජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට ද යටත් ව ඉදිරිපත් කිරීමට මාධ්‍යවේදීන් සැලකිලිමත් විය යුතුය, යනුවෙන් මාධ්‍ය ආචාරධර්ම තුළ මේ පිළිබඳව දැක්වේ.

ඒ අනුව,

1) වීරවිල වැවේ තිබූ මළ සිරුරක් පිළිබඳ පුවත සඳහා, එම මළ සිරුරේ ඡායාරූපය නොමැතිව පුවත පළ කිරීම ඔස්සේ, පුවතේ අන්තර්ගතයට බරපතළ හානියක් සිදුවේ යැයි ඔබ සිතන්නේද?

2) එසේ නම්, එම මළ සිරුර දැක්වෙන මෙම ඡායාරූපය පුවතට අවශ්‍යද?

3) එසේ නම් ඇතැම් පුද්ගලයෙකුට නැරඹීමට නොහැකි තරම් සංවේදී විය හැකි මෙම ඡායාරූපය රහිතව ද පුවත පළ කිරීමට හැකියාවක් නොමැති ද?

Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා ගැටළුකාරී මාධ්‍ය වාර්තාකරණයන්/ආචාර ධාර්මික මාර්ගෝපදේශ කඩකිරීම් මෙම Google පෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) ඔස්සේ අපට එවන්න.